# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,935/6 — 1970 දෙසැම්බර් 11 වැනි සිකුරාදා — 1970.12.11


(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරනු ලැබේ.)

# III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පණත (460 වෙනි පරිච්ඡේදය)

#### 39 (1) වැනි වගන්තිය යටතේ පැවරීමේ ආඥාව අවලංගු කිරීම

ජේ. 69/70 ඊ 453
යොමු අංකය :———————
එල්ඩී/ඒ—392.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පනවන ලද්ද වූ අංක 14,930 හා 1970 ඔක්තෝබර් මස 30 වැනි දින. දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පලකරන ලද 1970 අංක 330 හා 1970 ඔක්තෝබර් මස 18 වෙනි දින දරණ ආඥාවෙහි පහත සඳහන් උපලේඛණයෙහි වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම මහරැජින වෙත පැවරී තිබේ.

එනමුත්, මේ කියන ඉඩමේ භුක්තිය තවම මහරැජින වෙනුවෙන් භාරගෙන නැත. එබැවින් කෘෂිකර්ම හා ඉඩම් ඇමති හෙක්ටර් සෙනරත් රාජකරුණා බණ්ඩා කොබ්බෑකඩුව වන මම, එම ඉඩම අත්කර ගැනීමේ පනතේ (460 වෙනි පරිච්ඡේදය) 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව 14,930 හා 1970 ඔක්තෝබර් මස 30 වැනි දින රජයේ ගැසට් පත්‍රයෙන් පල කරන ලද ඉහත සඳහන් 1970 අංක 330 හා 1970 ඔතෝබර් මස 18 වෙනි දින දරණ ආඥාව අවලංගු කරමි.

එච්. එස්. ආර්. බී. කොබ්බෑකඩුව,
කෘෂිකර්ම හා ඉඩම් ඇමති.

1970 දෙසැම්බර් මස 10 දින,

### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ, කටුකැලේ ග්‍රාම සේවක කොට්ඨාශයේ මහනුවර නගර සභා සීමාව තුළ, කටුකැලේ අංක 3 දරණ කොට්ඨාශයේ, කටුකැලේ ගමේ පිහිටි, සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 359 සහ 363 දරණ ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, ප. 10.1 ක්වූ පහත සඳහන් මායිම්වල පිහිටි ඉඩම් කැබැල්ල :—

උතුරට : සිරිමාවෝ බණ්ඩාරනායක මාවත ;

නැගෙනහිරට : පී. එස්. ෂබ්දීන් අයිතිකම් කියන සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 357 ;

දකුණට : රජය සතු දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති ඉඩම ;

බටහිරට : පී. බී. මුදන්නායක සහ තවත් අය අයිතිකම් කියන සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 369.

12–647


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි

822/1—ජේ 19258—5,800 (70/12)